**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 | i. ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.<br>ii. ණයගැතියන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අඩමාන ණය ප්‍රතිපාදන සලසා නොතිබුණි.<br>iii. ණයගැති ගිණුම් 24 කට අදාලව රු.1,035,907 ක වූ බැර ශේෂ හර ශේෂවලින් කපාහැර ගිණුම්වල දක්වා තිබුණ. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී යොදාගත් ක්‍රමය ගිණුම් වලින් හෙළිදරව් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 | ආදායම් හඳුනාගැනීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් යටතේ දැක්විය යුතු සීනි පරීක්ෂණ උපකරණ කට්ටල (sugar test kits) 12 ක වටිනාකම වූ රු.120,000 ක් සදොස් ලෙස කිතුල් ව්‍යාපෘති අංශයේ තොගයට එකතු කර තිබුණි.

(ආ) 2010 ප්‍රත්‍යාගණනය කර තිබූ වාහන 04 ක් ප්‍රවර්තන වර්ෂයේදී රු.2,536,788 කට විකිණීමෙන් ලද ලාභය වූ රු.1,169,776 ක් වර්ෂයේ ආදායමට ගෙන තිබූ අතර ඊට අතිරේකව එම වාහන ප්‍රත්‍යාගණනය කිරීමෙන් උද්ගත වූ රු.1,683,476 ක සංචිතයද වර්ෂයේ ආදායමට ගෙන තිබීමෙන් එම මුදලින් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉදිකිරීම් කටයුතු අවසන් කර නොමැති තාක්ෂණ සේවා ගොඩනැගිල්ල සඳහා රු.8,730,724 ක් ද මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය සඳහා රු.1,787,500 ක් ද, ලක්කම් ගොඩනැගිල්ල සඳහා වැය කරන ලද රු.1,621,401 ක් ද වශයෙන් වූ රු.12,139,625 ක් ගොඩනැගිලි වටිනාකමට එකතු කර තිබුණි.

(ඈ) වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ රු.1,041,600 ක් වටිනා ලැප්ටොප් පරිගණක 03 ක් වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි. ඒ අනුව රු.208,320 ක ක්ෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) කාර්යාලීය ලී බඩු උපකරණ, පුස්තකාල පොත් ඇතුළු ස්ථාවර වත්කම් විෂයයන් 12 ක් තවදුරටත් ක්ෂය කළ හැකි අගය වූ රු.26,881,326 ක්ෂය කර නොතිබුණි.

(ඊ) ස්ථාවර වත්කම් විකුණුම් ලාභ රු.1,169,776 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි බදු ගෙවීම් පෙර ලාභයට ගලපා නොතිබුණි. ස්ථාවර වත්කම් විකුණා ලද මුදල රු.2,536,780 ක් වුවද එය රු.2,853,252 ක් වශයෙන් රු.316,472 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන යටතේ දක්වා තිබුණි.

(උ) ප්‍රවර්තන වර්ෂයේ පොලී ආදායම වූ රු.1,182,370 ක් සහ පොලී වියදම ව රු.11,695 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි පොලී යටතේ වෙනම දක්වා නොතිබුණි.

(ඌ) 2011-2013 වර්ෂ 03 වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම වෙනුවෙන් දරන ලද වියදම වර්ෂයේ වියදම ලෙස ආදායම් ගිණුමට හර කිරීම වෙනුවට එම වියදමින් රු.673,850 ක් ආදායම් ගිණුමට හර කර, රු.1,347,702 ක මුදලක් වෙනත් ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 1.2.3 නොසැසඳු පාලන ගිණුම්

මූල්‍ය වාර්තා අනුව දැක්වෙන පහත වියදම් විෂයයන් හා අදාල උපයෝගී ලේඛන අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය වාර්තා අනුව වටිනාකම රු. | උපයෝගී ලේඛන අනුව වටිනාකම රු. | වෙනස රු. |
|---|---|---|---|
| ආරක්ෂක වියදම් | 15,957,956 | 17,219,902 | 1,261,946 |
| විදුලිය | 10,811,791 | 11,045,144 | 233,353 |

### 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) අවසන් ගිණුම් වල දක්වා තිබූ තොග සහ තොග සත්‍යාපන වාර්තාවල දක්වා තිබූ තොග අතර පහත වෙනස්කම් විය.

| අංශය | අවසන් ගිණුම් අනුව රු. | තොග සත්‍යාපන වාර්තා අනුව රු. | වෙනස රු. |
|---|---|---|---|
| උප ගබඩාව වාත්තු අංශය | 3,048,963 | 3,034,606 | 14,357 |
| ගම්මාන සංවර්ධන අංශය සහ කිතුල් වැඩසටහන | 16,509,779 | 16,743,719 | (233,940) |
| රබර් භාණ්ඩ සංවර්ධන අංශය | 8,919,115 | 4,555,591 | 4,363,524 |
| | 28,477,857 | 24,333,916 | 4,143,941 |

ඉහත වෙනස්කම් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය රු.4,143,941 කින් වැඩිවීමට බලපා තිබුණි.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය වාර්තාවල ජංගම වත්කම් යටතේ ලැබිය යුතු වැට් බදු ලෙස රු.12,860,357 ක් දක්වා තිබුණ ද, වර්ෂයේ අවසානයට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට යවන ලද බදු වාර්තාවේ එය ගෙවිය යුතු වැට්බදු රු.149,749 ක් ලෙස දක්වා තිබීමෙන් රු.13,010,106 ක පැහැදිලි නොවූ වෙනසක් විය.

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### (අ) ලැබියයුතු ගිණුම්

(i) ණයගැති කාලවිශ්ලේෂණය අනුව ලැබියයුතු ගිණුම් 30 කට අදාලව මුළු වටිනාකම රු.54,888,710 ක් වූ අතර වසර 1 ට අඩු රු.14,443,562 ක් ද, වසර 1- 2 ත් අතර රු.3,758,618 ක ද, වසර 2-4 ත් අතර රු.1,936,495 ක් ද, වසර 4-5 ත් අතර රු.8,277,793 ක් ද, වසර 5 ඉක්ම ව රු.26,472,242 ක් ද විය. එම ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර 10% ක් වූ රු.5,047,335 ක බොල්ණය ප්‍රතිපාදනයද ඒ සඳහා ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ii) ගිණුම් අනුව "ගණුදෙනුකරුවන්ට වැඩිපුර ගෙවීම්" (customer over payment) වශයෙන් දක්වන ලද එකතුව රු.464,890 ක ණයගැති ගිණුම් 03 ක බැර ශේෂ පැවති අතර එසේ වීමට හේතු විගණනයට පැහැදිලි නොකරන ලදී.

(iii) එකතුව රු.808,978 ක විවිධ ණයගැතියන් රු.462,845 ක් හා ණයගැති අගරු චෙක්පත් වටිනාකම රු.346,133 ක් අනුමැතියකින් තොරව ගිණුම් වලින් කපාහැර තිබුණි.

(iv) මණ්ඩලයේ බැංකු ගිණුම් 5 ක ප්‍රවර්තන වර්ෂය අවසානයට රු.3,125,837 ක හඳුනා නොගත් තැන්පත් තිබුණු අතර ඒවා අවුරුදු 04 ට වැඩි රු.549,236 ක් ද, අවුරුදු 03 ට වැඩි රු.74,209 ක් ද, අවුරුදු 2-3 අතර රු.986,341 ක් ද, අවුරුදු 1-2 අතර රු.941,074 ක මුදලක්ද වශයෙන් තිබු අතර ඒවා හඳුනාගෙන ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.කෙසේ වෙතත් 2009 වර්ෂයේ සිට මේ ප්‍රමාණය ක්‍රමයෙන් අඩුකරගෙන තිබුණි.

(v) පෙර වර්ෂ වල පෙර ගෙවුම් කර තිබුණද ඒවා නිරවුල් කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ආයතන 07 ක් සඳහා නැවතත් රු.17,416,686 ක පෙර ගෙවුම් කර තිබුණ.

#### (ආ) ගෙවියයුතු ගිණුම්

(i) කාර්මික ජනපද වලින් ඉවත් වූ බවට නිරීක්ෂණය වූ කර්මාන්තකරුවන් 331 ට අදාලව රු.6,565,529 ක් ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුම් වල සදොස් අගයන් දක්වා තිබුණි.

(ii) කාර්මික ජනපදවල පවතින රජයේ ඉඩම් සින්නක්කර පැවරීම් නොකළ හැකි වුවත්, කුලී සින්නක්කර ගැණුම් ක්‍රමය යටතේ ඉඩම් සින්නක්කර පැවරීමේ ක්‍රමයක් ක්‍රියාත්මකකර එවැනි කර්මාන්තකරුවන් 126 කට ආපසු ගෙවිය යුතු තැන්පතු රු.14,843,613 ක් මූල්‍ය වාර්තාවල දක්වා තිබුණි.

(iii) වර්ෂ 3 ට වැඩි ආපසු ගෙවිය යුතු ලංසු සුරක්ෂණ තැන්පතු වශයෙන් රු.887,239 ක පැවති නමුත් ප්‍රසම්පාදන කාර්යය පරිපාටිය අවසන් වූ පසු ගෙවිය යුතු එවැනි ලංසු සුරක්ෂණ තැන්පතු ගිණුම් වල පැවතුණි.

(iv) වසර 03 ට වැඩි රු.48,048,396 ක් වූ ණයහිමි ශේෂයන් ගිණුම්වල පවතින අතර එම ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා වර්ෂය තුලදී ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| විස්තර | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| කෙරීගෙන යන වැඩ | 12,299,692 | සත්‍යාපන වාර්තා |
| නිමි තොග | 2,480,536 | සත්‍යාපන වාර්තා |
| පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයට මිලදීගත් අමුද්‍රව්‍ය | 20,422,093 | අමුද්‍රව්‍ය ලැබීම් නිකුත්කිරීම් වටිනාකම් ඇතුලත් තොග ලෙජර් |
| පෙර ගෙවුම් | 93,117,377 | යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන පෙර ගෙවුම් ලේඛන |

### 1.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය

සේවයෙන් ලැබෙන සම්පූර්ණ ඉපැයීම් මත ගණනය කරන ලද දායකමුදල් සේවක අර්ථසාධක අරමුදලට ගෙවීමට බැඳී සිටින නමුත් ප්‍රවර්තන වර්ෂයේ සේවක දීමනා වශයෙන් ගෙවන ලද රු.49,024,124 ක මුදලක් සඳහා රු.10,785,306 ක දායක මුදල් අරමුදලට ගෙවා නොතිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16 වන වගන්තිය

සේවා නියුක්තිකයා උපයන මුළු ඉපැයීම් වලින් ගණනය කරන ලද දායක මුදල් සේවක භාරකාර අරමුදලට ගෙවීමට සේවා යෝජකයා බැඳී සිටින නමුත් ප්‍රවර්තන වර්ෂය තුල සේවක දීමනා වශයෙන් ගෙවන ලද රු.49,024,124 ක මුදලක් සඳහා රු.1,470,725 ක දායක මුදල් අරමුදලට ගෙවා නොතිබුණි.

මේ පිළිබඳව සභාපතිවරයා ඉදිරිපත් කළ අදහස වන්නේ "භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත වී ඇත්තේ මූලික වැටුපට සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ගණනය කිරීමෙන්" යන බවයි.

(ඇ) 2011 අංක 22 දේශිය ආදායම් සංශෝධන පනත

අදාල මාසයේ උපයන විට බදු ඊළඟ මස 15 දිනට පෙර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද 2011 ජනවාරි සිට මැයි දක්වා කාලයට අදාලව රු.269,375 ක උපයන විට බදු සේවකයාගේ වැටුපෙන් අඩුකර දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **රජයේ මුදල් රෙගුලාසි**

(i) මු.රෙ.110

හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ii) මු.රෙ.371(2)

නිකුත් කළ අත්තිකාරම් අදාල කාර්යය නිම කළ විගස පියවිය යුතු වුවත් වසර ගණනාවකට අදාල රු.2,344,750 ක අත්තිකාරම් මුදල් විගණන දිනය (2012.03.01 දින) වන විටත් පියවා නොතිබුණි.

(iii) මු .රෙ.387

චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් නිතරම සොයා බැලිය යුතු අතර බැංකු ගිණුම් වලින් අයිරා ගැනීම නොකළ යුතුය. එහෙත් 2011 දෙසැම්බර් 31 දිනට රු.2,024,206 ක් සහ රු.159,835 වශයෙන් බැංකු ගිණුම් දෙකක ඍණ ශේෂ පැවතුණි.

(iv) මු .රෙ.394 හා 396

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් වලංගු කාලය ඉක්මවූ සහ නිකුත් කර මාස 06 ක් ඉක්මවූ රු.63,957 ක චෙක්පත් 8 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(v) මු .රෙ.453

අනුමත වැටුප් පරිමාණවලට අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා වැටුප් ගෙවා ඇති බවට තහවුරු කර ගැනීම සඳහා පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා නොතිබුණි.

(vi) මු.රෙ.751

ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොතිබුණි

(ඉ) **චක්‍රලේඛ**

(i) 1990 ඔක්තෝබර් 10 දින හා 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

හය මාසයකට වරක් ඉන්ධන දැවීම පරීක්ෂා කළ යුතු වුවත් මණ්ඩලයේ වාහන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 2.11.3 | අදාල ආකෘති ප්‍රකාරව ටෙන්ඩර් මණ්ඩල වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| 2.14.1 | අබලි ද්‍රව්‍ය ප්‍රවාහනයට විවිධ දිස්ත්‍රික්ක වලට කිලෝවකට යෝජිත මිලක් යටතේ ගෙවීම් කර තිබුණද තරඟකාරී අවම මිලක් ලබා නොගෙන ප්‍රවාහන ගාස්තු වශයෙන් වර්ෂය තුල රු.611,520 ගෙවීම් කර තිබුණි. |
| 6.2.2 | ඇතැම් අවස්ථා වලදී ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් සැපයුම්කරුවන්ට ලබා දී නොතිබුණි. |
| 6.3.6 | ලංසු විවෘත කිරීම් පිළිබඳ කටයුතු නියමිත ආකෘතියට අනුව වාර්තා කර නොතිබුණි. |

## 1.2.8 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙණු

-----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011-2013 කාලපරිච්ඡේදය වෙනුවෙන් සකස් කළ සංයුක්ත සැලැස්ම සඳහා එකතුකල අගය මත බදු රහිතව රු.1,985,500 ක් වැය කර සකස් කර තිබුණි. ලියාපදිංචි තැපැලෙන් පමණක් ලංසු කැඳවා රු.මිලියන 2.2 ලංසුව ඉදිරිපත් කළ සේවා සැපයුම්කරු තෝරා ගෙන තිබුණු අතර ඔහු තෝරා ගැනීමට පෙර මණ්ඩලයේ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා නොතිබුණි.සේවා සැපයුම්කරුගෙන් අවස්ථා දෙකකදී ලබා ගෙන තිබූ වට්ටම් සහන මත කොන්ත්‍රාත් මිල රු.1,985,500 ක් දක්වා අඩුකරගෙන ඒ සඳහා මණ්ඩලයේ සුළු ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබා තිබුණි.

(ආ) ආරක්ෂක සේවා කටයුතු සඳහා 2011 වර්ෂයේ නව මිලගණන් කැඳවීමේදී ප්‍රසම්පාදන රෙගුලාසි අභිබවා 2010 මාර්තු 10 දින ආරක්ෂක සේවා අමාත්‍යාංශය එවා තිබූ ලිපියක් පදනම් කරගෙන රු.මිලියන 12.9, රු.මිලියන 13.1, රු.මිලියන 14.1, රු.මිලියන 16.7 ලංසු ප්‍රතික්ෂේප කර රු.මි.17.8 කට මිල ඉදිරිපත් කර තිබූ ආරක්ෂක සේවා සමාගම තෝරා ගෙන තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

2011 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය රු.මිලියන 228 ක් වූ අතර වර්ෂය තුල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු.මිලියන 234.8 ක ඌනතාවයක් විය.ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රජයේ දායකය වූ රු.මිලියන 221.2 ගණනය කිරීමට පෙර ඌනතාවය රු.මිලියන 240 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 5.2 ක වර්ධනයක් දක්නට ලැබුණි. අභ්‍යන්තර ආදායම් රු.මිලියන 28.8 කින් වැඩිවීම සහ පුනරාවර්තන වියදම් රු.මිලියන 24.5 කින් වැඩිවීම මේ සඳහා මූලිකව බලපා තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) කාර්මික ජනපද

දිවයින පුරා දිස්ත්‍රික්ක 15 ක කාර්මික ජනපද 18 ක හිස් වූ කර්මාන්ත ඒකක 109 ක් ද, අක්‍රීය කර්මාන්ත ඒකක 120 ක් ද පැවතුණි. අක්‍රිය කර්මාන්ත ඒකකවල වසා ඇති කර්මාන්ත ඒකක 45 ක් ද අනවසර පදිංචි ඒකක 51 ක් ද නව කර්මාන්ත වෙන්කිරීම් ඒකක 28 ක් ද තිබුණි.

#### (ආ) ගම්මාන සංවර්ධන ව්‍යාපෘති යටතේ පොදු සේවා මධ්‍යස්ථාන

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගම්මාන සංවර්ධන වැඩසටහන් යටතේ නිෂ්පාදන ගම්මාන 106 ඇතිකර තිබුණද ඒවායේ ඉදිකර තිබූ පොදු සේවා මධ්‍යස්ථාන වලින් මධ්‍යස්ථාන 19 ක් ජනතා අයිතියට පත්කර නොතිබුණි.

(ii) ජනතා අයිතියට පවරා තිබුණු පොදු සේවා මධ්‍යස්ථාන 75 න් 46 ක් ක්‍රියාකාර වන අතර 29 ක් අක්‍රීය වී තිබුණි.

(iii) ක්‍රියාකාර පොදු සේවා මධ්‍යස්ථාන වලින් ද ආන්තික ක්‍රියාකාරීත්වයෙන් යුත් මධ්‍යස්ථාන 50% කට ආසන්න සංඛ්‍යාවක් පැවතුණි.

(iv) අපේක්ෂා කළ ප්‍රතිලාභීන්ට වඩා අඩු ප්‍රතිලාභීන් ප්‍රමාණයක් බොහෝ මධ්‍යස්ථානවල දක්නට ලැබුණි.

උදාහරණ:-

| ව්‍යාපෘතිය | අපේක්ෂිත ප්‍රතිලාභීන් ගණන | ප්‍රතිලාභය ලබන ප්‍රමාණය |
|---|---|---|
| කුරුඑගම (මැටි) | 91 | 08 |
| කුඩාවැල්ල (කොහු) | 180 | 70 |
| උඩුකිරිවල (මැටි) | 600 | 210 |
| බෙදිගංතොට (අත් කඩදාසි) | 25 | 03 |
| දිඹුල්කම්බු (අත් කඩදාසි) | 30 | 05 |

**(ඇ) ගම්මාන සංවර්ධන ව්‍යාපෘති**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

**(i) කොහු කර්මාන්ත**

හොරණ ඉලිඹ ප්‍රදේශයේ කොහු කර්මාන්ත සඳහා පොදු සේවා මධ්‍යස්ථානය හා යන්ත්‍ර හා උපකරණ සඳහා රු.මිලියන 3.6 ක් වැය කර තිබූ අතර 2011 වසර අවසානය දක්වා වූ වසර 05 ක් පුරා බොහෝ කාලයක් එම ව්‍යාපෘතිය නෂ්කාර්යව තිබුණි.

රත්නපුර බඹරගස්තැන්න කොහු කර්මාන්තයට යන්ත්‍ර හා උපකරණ සඳහා රු.මිලියන 1.3 ක් වැය කර තිබූ අතර එය අසාර්ථක වීම මත 2011 වර්ෂයේ සිට පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට භාරදී ඇත. එම ක්‍රියාමාර්ගය කර්මාන්තයේ යෙදී සිටින්නන්ගේ ආර්ථිකය නංවාලීම වැනි ව්‍යාපෘතියේ අරමුණ හා එකඟ නොවන බැව් නිරීක්ෂණය විය.

**(ii) කම්මල් ගම්මාන**

එපිටවත්ත කම්මල් ගම්මානයේ පොදු සේවා මධ්‍යස්ථානයට ලබා දී තිබූ රු.257,525 ක් වටිනා භාණ්ඩ සහ එහි සාමාජිකයින්ට ලබා දී තිබූ රු.32,175 ක් වූ භාණ්ඩ නියමිත ප්‍රමිතියෙන් තොර වීම සහ ඒවා අක්‍රිය වීම නිසා වසර 04 ක සිට නිෂ්කාර්යව පැවතුණි.

පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුගොඩ කම්හල් ගම්මානයට ලබාදී තිබූ රු.210,000 ක් වටිනා බෙල්ට්හැමර් යන්ත්‍රය රු.29,000 ක් වටිනා කිණිහිර දෙකක් සහ රු.21,775 ක් වටිනා දඬුඅඩු 02 ක් ප්‍රමිතියෙන් බාල වීම නිසා අක්‍රිය වී තිබුණි.

**(iii) ස්වර්ණාභරණ ගම්මාන**

ඇහැලියගොඩ නාකන්දල ස්වර්ණාභරණ ගම්මානය සඳහා ලබා දී තිබූ රු.168,298 ක් වූ භාණ්ඩ නියමිත ප්‍රමිතිය නොමැති වීම නිසා භාවිතයෙන් තොරව පැවතුණි.

ජනතා අයිතියට පත් කරන ලද ගම්මාන ව්‍යාපෘති සම්බන්ධයෙන් සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වන ලදී. "රේඛීය අමාත්‍යාංශයේ වැඩසටහනක් අනුව ගම්මාන ව්‍යාපාති වැඩසටහන කයාත්මක කරන ආයතනය ලෙස මණ්ඩලය කටයුතු කරනු ලබන අතර ගම්මාන ව්‍යාපෘති ඉදිකිරීම් වැඩ අවසන් කළ පසු ජනතා අයිතියට පවරනු ලබයි. එය පවත්වාගෙන යාමට ප්‍රතිලාභීන් සාමාජිකත්වය දරන සමූපාකාර සමිතියකට පවරනු ලබයි. ගම්මාන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පසු විපරම් කටයුතු මණ්ඩලයෙන් සිදුකරණු ලබය"

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රත්නපුර ප්‍රදේශයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් 2010 වර්ෂයේ ආරම්භ කර එක් පාඨමාලාවක් පමණක් පවත්වා 2011 අප්‍රේල් 07 දින අදාල ව්‍යාපෘතිය අසාර්ථක වීම මත වසා දමා පරිගණක ඇතුළු උපකරණ ප්‍රධාන කාර්යාලයට රැගෙනවිත් තිබුණි.මේ සඳහා ගොඩනැගිලි පහසුකම් රත්නපුර තාක්ෂණ විද්‍යාලයෙන් ලබාගෙන තිබූ අතර පරිගණක විද්‍යාගාරයක් බවට පත් කිරීම, වායුසමීකරණය කිරීම යනාදියට රු.731,224 ක වියදමක් දරා තිබුණු අතර එය නිෂ්කාර්ය වී තිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩ සටහනට දිස්ත්‍රික් 05 ක් සඳහා මැටි උඳුන් 35,410 ක් 2011 පෙබරවාරි 28 දිනට පෙර සැපයීමට 2011 ජනවාරි 05 දින රු.7,231,517 කට ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද 2011 ජුනි 28 දින වන විට නියමිත උඳුන් ප්‍රමාණයෙන් වටිනාකම රු. 3,244,845 ක් වූ උඳුන් හෙවත් ගිවිසුම්ගත වටිනාකමින් 46% ක් පමණක් සපයා තිබූ බැවින් 2011 ජුලි 01 දින ගිවිසුම අවලංගු කර තිබුණි.

(ඇ) මණ්ඩලයේ පළමු කාර්තුවට අයත් එකතු කළ අගය මත බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමේදී රු.813,387 ක් අඩුවෙන් යවා තිබුණි.

(ඈ) ඩෙක්ස්ටොප් පරිගණක 05 ක් මිලදී ගැනීමේදී සියලු පිරිවිතරයන් සපුරා තිබූ දෙවන අවම මිල වෙනුවට තෙවන අවම මිල සහිත ලංසුව තෝරා ගැනීම නිසා මණ්ඩලයට රු.17,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඉ) අලෙවිකරන අංශය සඳහා පරිගණක 03 ක් මිලදී ගැනීමේදී සියලු පිරිවිතරයන් සම්පූර්ණ කර තිබූ දෙවන අවම මිල වෙනුවට හත්වන අවම මිල සහිත ලංසුව තෝරා ගැනීම නිසා රු.13,500 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය

අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව අබලි මිලදී ගැනීම, විකිණීම සහ ගබඩා කිරීමට අදාලව රෙගුලාසි පද්ධතියක් සකස් කර ක්‍රියාත්මකකර නොතිබුණි.මෙම තත්ත්වය හේතු කොටගෙන මිලදී ගැනීමේදී, විකිණීමේදී හා ගබඩා කිරීමේදී විවිධ අක්‍රමිකතා සිදු වී ඇති බව පහත කරුණු අනුව නිරීක්ෂණය වී තිබුණි.

(i) සමාලෝචිත වර්ෂයේ හා 2010 වර්ෂයේදී පෙර ගෙවුම් ලෙස ආයතන 06 කට රු.4,625,697 මුදලක් ගෙවා තිබුණද, අදාල භාණ්ඩ මණ්ඩලයට ගෙන ඒමට කටයුතු කර නොතිබුණි.

(ii) 2010 හා 2011 වර්ෂවලදී පෙර ගෙවුම් කර මිලදී ගත් රු.4,095,970 ක් වටිනා අබලි ද්‍රව්‍ය සම්බන්ධයෙන් 2011 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමේ වවුචර් පිළියෙල කර නොතිබුණි.

(iii) කුඩා කර්මාන්තකරුවන්ට සාධාරණ මිලකට අබලි ද්‍රව්‍ය බෙදාහල යුතු වුවද ඊට පටහැනිව 2011 ජනවාරි සිට ජූලි දක්වා රු.16,708,157 ක් වටිනා අබලි තොග විකුණුම් වලින් 50% ක් කර්මාන්තකරුවන් 4 දෙනෙකු අතරේ බෙදාහැර තිබුණි.

(iv) සමහර අවස්ථා වල අබලි ද්‍රව්‍ය නිසි පරිදි කිරා මැන භාර නොගන්නා බැවින් සහ පිටතදීම විකුණන අවස්ථාවල නිකුත් කරනු ලබන ආවරණ භාණ්ඩ ලැබීම් පත්‍රිකා සහිත භාණ්ඩ විකුණුම් වල වටිනාකම රු.415,458 ක් විය.

(v) ඉමියන්ගොඩ අබලි ද්‍රව්‍ය රැසකරන මධ්‍යස්ථානයේ අබලි තොග 2011 අප්‍රේල් 29 දින සිට වෙන්දේසියක් පවත්වා විකුණා තිබූ අතර අබලි ද්‍රව්‍ය මධ්‍යස්ථානයද වසා දමා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

ලිපිලේඛන අනුව පිරිවැය රු.මිලියන 4.6 ක් වූ මෙට්‍රික් ටොන් 304.7 ක අබලි තොගයක් ඉතිරිව පවතින බවට නිරීක්ෂණය වුවද සත්‍ය වශයෙන් අලෙවි කළ හැකි එවැනි තොග ශේෂයක් නොපවතින බැවින් එම ප්‍රමාණයෙන් තොග ඌනතාවයක් නිරීක්ෂණය විය.

පසුගිය වර්ෂවල ලබාගෙන තිබුණද අවසන් ගිණුම් අනුව ණයට ගැණුම් හා ණය හිමියන් යටතේ දක්වා නොතිබූ රු.490,493 ක මුදලක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි.

(ආ) උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා මණ්ඩලයට ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරුවන් බඳවා ගැනීමට විභාගය පැවැත්වීමේ කටයුතු ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ විශ්‍රාම ලබා තිබ පුද්ගලයෙකුට පවරා ඒ සඳහා ගෙවිය යුතු මුදලින් 50% අත්තිකාරම වූ රු.65,000 මුදල එම පුද්ගලයාගේ පුද්ගලික බැංකු ගිණුමට ගෙවීම් කර තබීම නිසා විභාගයක් පැවැත්වීමේ රහස්‍ය භාවය ආරක්ෂා වී නොතිබුණි.

### 3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පැලියගොඩ රබර් මධ්‍යස්ථානයේ අක්‍රීය යන්ත්‍ර 4 ක් ද, ප්‍රයෝජනයට යොදා නොගන්නා යන්ත්‍ර 5 ක් ද පැවතුන අතර මණ්ඩලයට අයත් කලින් කොළඹ දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන ගිය වර්ග අඩි 2000 ක් වූ ගොඩනැගිල්ල මාස 06 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) පාවිච්චියට ගත නොහැකි බැව් දන්වමින් පාවහන් නිෂ්පාදනය කරනු ලබන මැෂින් 16 ක් බොහෝ කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ඉහත මධ්‍යස්ථානයේ තැන්පත් කර තිබුණි.

(ඇ) ප්‍රතිලාභීන්ට බෙදා දීම සඳහා මිලදී ගෙන ඇති ගම්මාන ව්‍යාපෘතියට අයත් රු.2,771,972 ක් වටිනා පාවහන් නිපදවන මැෂින් 28 ක් ඉහත සම්භාණ්ඩ මධ්‍යස්ථානය තුල නිෂ්කාර්යව ගබඩා කර තිබුණි.

(ඇ) ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොදු සේවා මධ්‍යස්ථාන වලට හා ප්‍රතිලාභීන් සඳහා මිලදීගත් රු.11,712,136 වටිනා භාණ්ඩ ගබඩාවේ පැවතුණි. මෙම භාණ්ඩ වර්ෂ 1 ත් 6 ත් අතර කාලයක තුලදී මිලදීගත් භාණ්ඩ වේ.

මෙම භාණ්ඩ මිලදී ගෙන බොහෝ කාලයක් ගත වීම නිසා ඒවායේ වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි.සමහර භාණ්ඩ යල්පැන ගොස් තිබුණු අතර සමහර භාණ්ඩ භාවිතයෙන් තොරව පැවතීම නිසා නැවත වියදමක් දරා අළුත්වැඩියා කිරීමට සිදුවී තිබුණි. සමහර භාණ්ඩ මීයන් වැනි සතුන් විසින් විනාශ කර තිබුණු බවට නිරීක්ෂණය විය.

(ඉ) රත්නපුර පල්ලෙගෙදර සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සඳහා රු මිලියන 5.4 ක මුදලක් වැයකර තිබූ අතර එය 2006 වර්ෂයේ සිට වසර 5ක කාලයක් පුරා නිෂකාර්යව පැවතුණි. සභාපතිවරයාගේ පිළිතුරු අනුව දැනට පුද්ගලික ආයතනයක් විසින් බදු පදනම මත නිෂ්පාදන කටයුතු කරගෙන යනු ලබන බවට දක්වා තිබුණද එය මෙම වැඩසටහනින් බලාපොරොත්තු වූ මූලික අරමුණු වලින් බැහැර වී තිබුණි.

(ඊ) බදුල්ල පළාත් කාර්යාලය ඉදිරිපිට රු.1,412,000 ක් වැයකර ඉදිකරන ලද නිෂ්පාදන ප්‍රදර්ශනාගාරය හා අලෙවි මධ්‍යස්ථානය 2008 වර්ෂය අවසන් වන විට ඉදිකිරීම් නිම කර තිබුණද එය සමාලෝචිත වසර අවසානය දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(උ) ගෝනපුර ආහාර ව්‍යාපෘතිය සඳහා 2006 පෙබරවාරි 03 දින රු.298,500 ක් වැය කොට මිලදී ගන්නා ලද Dough mixer machine 3 ක ගබඩාවේ තිබු අතර ඒවායේ වගකීම් කාලයද ඉක්ම ගොස් තිබුණි.

(ඌ) මහියංගන මියුනුගල දිඹුලවත්ත නම් වූ පර්චස් 80 ක ඉඩම තුල පිහිටි වර්ග අඩි 1400 කින් යුත් ජලය,විදුලිය සහිත ගොඩනැගිල්ල හා ඉඩම වර්ෂ 14 කට අධික කාලයක සිට කිසිදු කාර්යකට යොදාගෙන නොතිබුණි.

(එ) පන්නල යෝග්‍ය තාක්ෂණ මධ්‍යස්ථානයේ 25 දෙනෙකුට පමණ නවාතැන් ගතහැකි නේවාසිකාගාරයක් පවතින අතර, 2004 වර්ෂයේ සිට එය වසා දමා තිබුණි.

(ඒ) බිම්මල් වගාව සඳහා මිලදී ගෙන තිබූ රු.1,180,000 ක් වටිනා බිම්මල් වියලන යන්ත්‍රයේ කොටසක් අස්ථානගත වී ඇති අතර, ඉතිරි කොටස් ඉන්වෙන්ට්‍රිගත කිරීමකින් තොරව නිෂ්ක්‍රියව මණ්ඩලීය භූමියේ පැවතුණි.

(ඔ) වසර 18 ක කාලයක සිට ගණුදෙනු නතර කර තිබෙන කර්මාන්ත සමාගමේ රු.මිලියන 5.3 ක ආයෝජනය කිසිදු වටිනාකමක් නොමැතිව අවසන් ගිණුම් වල ස්ථාවර වත්කම් යටතේ පෙන්නුම් කර තිබුණි.

(ඕ) ප්‍රවර්තන වර්ෂය තුලදී ප්‍රාදේශීය කාර්යාලවල සහ මණ්ඩලයේ වෙනත් අංශ යටතේ පැවති බැංකු ජංගම ගිණුම් 25 ක් වසා දමා තිබුණද, එයින් බැංකු ගිණුම් 11 ක තවදුරටත් රු.161,900 ක වාසිදායක ශේෂයක්ද, බැංකු ගිණුම් 02 ක වූ රු.2,184,041 ක අයිරා ශේෂයක්ද මූල්‍ය වාර්තා වල දක්වා තිබුණි.

(ච) දැනට භාවිතයේ නොපවත්නා GST බදු වශයෙන් රු.1,424,654 ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

## 3.5 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව නිසි වැටුප් පියවරයන් අදාල කර නොගැනීම නිසා සාවද්‍ය වැටුප් ගණනය කිරීමෙන් 2006 සිට 2010 දක්වා කාල සීමාව තුල රු.6,268,931 ක් වැඩිපුර ද, රු.1,212,589 ක් අඩුවෙන් ද ගෙවා තිබුණි.

## 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

මණ්ඩලයේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | අතිරික්තය (ඌණතාවය) |
|---|---|---|---|
| විධායක | 264 | 206 | (58) |
| ලිපිකරු හා සමාන්තර | 236 | 131 | (105) |
| සුළු සේවක | 264 | 195 | (69) |
| | 764 | 532 | (232) |

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ප්‍රකාරව සමාලෝචිත වසර අවසානය තෙක් බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරගෙන නොතිබුණි.

(ආ) 2006 මැයි මස සිට 2011 ජූලි 31 දක්වා මණ්ඩලය විසින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට පටහැනිව ස්ථිර තනතුරු 76 ක් හා කොන්ත්‍රාත් පදනමින් 09 ක් බඳවා ගෙන කොන්ත්‍රාත් කාලය වසර 02 සිට 04 දක්වා වූ කාලයන්ට අයත් නිලධාරීන් සේවයේ යෙදී සිටී. එසේම අනුමැතියකින් තොරව අනියම් පදනමින් 41 ක් බඳවාගෙන ඇති අතර ඔවුන්ගේ සේවා කාල පරාසය වසර 1 සිට 5 දක්වා වේ.

(ඇ) අධ්‍යක්ෂ තාක්ෂණික සේවා තනතුර සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර නොගෙන විද්‍යා හෝ ඉංජිනේරු උපාධියක් සමඟ අදාල ක්ෂේත්‍රයේ වසර 15 ක විධායක පළපුරුද්දක් සහ ඉන් වසර 08 ක ජ්‍යෙෂ්ඨ විධායක තනතුරක වියයුතු බවටත් පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කර තිබුණද ඒ සඳහා පත්කළ නිලධාරියා වසර 15 ක පළපුරුද්ද වෙනුවට පෞද්ගලික අංශයේ විවිධ කළමනාකරණ සේවාවල වසර 13 ක පළපුරුද්දක් ඇති බවට දක්වා තිබූ අතර අවුරුදු 08 ක ජ්‍යෙෂ්ඨ විධායක පළපුරුද්ද ලබා නොතිබුණි.ලබා තිබූ පළපුරුද්ද ද අදාල ආයතන වලින් සනාථ කරගෙන නොතිබුණි.

### 3.7 සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

සේවක පාර්තෝෂික සඳහා රු.මිලියන 106.6 ක වෙන්කර තිබුණද එම මුදල් ඵලදායී ආයෝජනයක යොදවා නොතිබුණි.

මේ පිළිබඳව සභාපතිවරයාගේ අදහස වූයේ ''භාණ්ඩාගාර ප්‍රතිපාදන මත වැටුප් හා පාර්තෝෂික ගෙවන නිසා ආයෝජනයට මුදල් යොදාගත නොහැකි බව'' යන්නයි.

### 3.8 වාහන උපයෝජනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගමින් ගමට තාක්ෂණය බෙදාහැරීමේ අරමුණින් 2009 වර්ෂයේ රු.8,711,713 ක වියදම් දරා මිලදී ගත් බස් රථය 2011 වර්ෂයට ඉලක්කගත සැලසුමකින් තොරව ප්‍රදර්ශන රාජකාරි 04 ක් සඳහා බැව් දක්වමින් යොදා ගෙන තිබුණු අතර ඒ සඳහා ද කිලෝමීටර් 2000 කට වඩා අඩුවෙන් ධාවනය කර තිබුණි.2010 වර්ෂයේද ගමන්වාර 08 ක් සඳහා කිලෝමීටර් 3098 ක් පමණක් ධාවනය කර තිබූ හෙයින් ඌණ උපයෝජිත තත්ත්වයක පැවතුණි.

(ii) ඉහත ව්‍යාපෘතියේ අසාර්ථකත්වය මත මෙම බස් රථය වැඩි කාලයක් ධාවනයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවැතුන අතර අධික වියදමක් දරා මිලදී ගත් රථය නිතරම අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුනි.

(iii) මණ්ඩලය සතු වාහන 41 ක් පවතින අතර මයිලෝමීටරය අක්‍රීයව පවතින වාහන 05 ක්ද නිරීක්ෂණය විය.

### 3.9 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

මණ්ඩලය විසින් පවත්වන ලද සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සම්පත්දායකයින් කුමන පදනමක් මත තෝරා ගත්තේද යන්න හා ඔවුන් සඳහා පැයකට රු.2500, රු.3500 හා පැය 06 කට රු.10000 යනාදී රේටයන් කුමන අනුමැතියක් මත ගෙව්වාද යන්න විගණනයට තහවුරු නොවීය.

## 4. ගණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

(අ) 2011-2013 වර්ෂ සඳහා මණ්ඩලය විසින් රු.මිලියන 2 ක් වැයකොට සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මෙන් හඳුන්වා දී තිබූ ක්‍රියාකාරකම් බොහොමයක් ඉටුකර නොතිබුණි.සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ ඉලක්කයන් ප්‍රගති වාර්තා සමඟ සැසඳීමේදී වර්ෂය අවසන් වන විට අංශයන් 07 කට අදාලව ඉටු නොවුණු ක්‍රියාකාරකම් 121 ක් පැවති අතර 50% වඩා ඉටු නොවුණු අවස්ථා 20 ක් විය.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

2011 වර්ෂය සඳහා වෙනමම ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට අනුමත කරගෙන නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

2003 ජුනි 02 දින හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1.4 වගන්තිය අනුව සෑම කාර්තුවකටම එක් වතාවක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද 2011 වර්ෂය සඳහා පවත්වා තිබුණේ එක් කමිටු රැස්වීමක් පමණි.

### 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 4.2.1 ජේදයට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් හා එහි අංක 4.2.2 ජේදයට අනුව ප්‍රසම්පාදන කාලසටහනක් ද සකස් කර නොතිබුණි.

### 4.5 අයවැය ලේඛනමය පාලනය

මූලධන වියදම් විෂයන් 2 ක් සඳහා රු. මිලියන 0.7 ක් ද, පුනරාවර්තන වියදම් විෂයන් 09 ක් සඳහා රු. මිලියන 8.8 ක් ද අයවැයගත වියදම් ඉක්මවා වැයදරා තිබුණි.

2003 ජුනි 03 දිනැති යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මාලාවේ 5.2.1 වගන්තිය අනුව අයවැය ලේඛනය සමඟ අයවැයගත ආදායම් වියදම් ගිණුම, අයවැයගත ශේෂ පත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

මේ අනුව අයවැය ලේඛනමය පාලනය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

(අ) ලක්කම් අලෙවි මධ්‍යස්ථානය කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ විකුණා පසුව මුදල් ගෙවීමේ පදනම මත අලෙවි කරනු ලබන අතර තොග ලැබීම් නිකුත් කිරීම සඳහා නිසි පරිදි තොග පොත්පත් පවත්වා නොතිබුණි.

(ආ) විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(i) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම
(ii) ගිණුම්කරණය සහ පරිගණක පද්ධතිය
(iii) ණයගැති හා ණයහිමි පාලනය
(iv) වාහන භාවිතය හා ලේඛන නඩත්තුව
(v) අබලි ද්‍රව්‍ය ගැණුම් විකුණුම් පිළිබඳ පාලනය
(vi) අත්තිකාරම්
(vii) තොග පාලනය